# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1894/22 - 2014 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : හාප/සං/2/ඉ.අ/88 KDS/HAR/4/2/1/34/.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2012/WS/363.

මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වන පියවරේ III අදියර යටතේ මැදවල නව සේවා ජලාශය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදසිය පත්තුව සුළු කොට්ඨාසයේ මැදවල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මු. පි. මහ/6379 දරන මූලික පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 0.1017 ක් පමණ වූ ඉඩම් කැබලි 03.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: නාගවල හේන; හිමිකම් කියන අය: බස්නායක මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ, අංක 221/ඩී, මැදවල ප්‍රාථමික පාසල අසල, මැදවල, හාරිස්පත්තුව; ප්‍රමාණය හෙක්ටයාර් 0.0046.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: ගල්වැටේ හේන; හිමිකම් කියන අය: හේරත් මුදියන්සේලාගේ හීන්බණ්ඩා, අංක 221/1/හේනේගම, පල්කුඹුර, මැදවල, හාරිස්පත්තුව; ප්‍රමාණය හෙක්ටයාර් 0.0078.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: ගල්වැටේ හේන; හිමිකම් කියන අය: හේරත් මුදියන්සේලාගේ සෝමරත්න බණ්ඩා, අංක 245, හේනේගම, පල්කුඹුර, මැදවල, හාරිස්පත්තුව; ප්‍රමාණය හෙක්ටයාර් 0.0893.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම 'තමන් හෝ ඔවුන්ගෙන්, ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015 පෙබරවාරි මස 11 වැනි දින පෙ.ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 පෙබරවාරි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්. එම්. පී. එස්. බී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01—346

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* KDS/UNU/4/6//LA/61/2011.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2011/ WS/174.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, නිකහැටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2014.11.12 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6381 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන "අත්තනැක් ගෙදර වත්ත" නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0023ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංක 1 - ඉඩමේ නම: අත්තනැක් ගෙදර වත්ත ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0023**

*මායිම්:- උතුරට*: එච්. එම්. එල්. කේ. හේරත් හිමිකම් කියන අත්තනැක් ගෙදර වත්ත සහ පඩිපෙළ; *නැගෙනහිරට*: පඩිපෙළ සහ එච්. එම්. එල්. කේ. හේරත් හිමිකම් කියන අත්තනැක් ගෙදර වත්ත; *දකුණට*: එච්. එම්. එල්. කේ. හේරත් හිමිකම් කියන අත්තනැක් ගෙදර වත්ත; *බටහිරට*: එච්. එම්. එල්. කේ. හේරත් හිමිකම් කියන අත්තනැක් ගෙදර වත්ත

හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනයන්

1. එච්. එම්. එල්. කේ. හේරත්, අංක 31/බී/1, නිකහැටිය, වට්ටප්පොල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 පෙබරවාරි මස 25 වැනි දින පෙ.ව. 10.00 ට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 පෙබරවාරි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම් ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ජී. කේ. ජී. ඒ. ආර්. පී. කේ. නන්දන,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2014 දෙසැම්බර් මස 12 වැනි දින
උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-331

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රලේඛ* : ඉ/1/2/58.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 3/J/82/L/142/VE.

අංක 388/11 හා 1986.02.12 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ වන පහත විස්තරයන්ට අදාළ දැන්වීම.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

*පිහිටීම* : සබරගමුව පළාතේ 'රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙල උඩ පළාතේ වතුකාරගොඩ ගමේ (කොටසක්)

සැළැස්මේ අංකය : අ. ග. සි. 477 අතිරේක 14

කැබලි අංකය: 219

ඉඩමේ නම: ඉහල බලංගොඩ වත්ත, උඩකන්දවත්ත, කළුන්දයවත්ත, කජුකොරටුවේවත්ත.

හිමිකම් කියන අය :

01. කන්දයියා සිවසිතම්බරම් මයා, සුගත්නාත්, කෝපායි.
02. සෙල්ලම්මා ඥානසුන්දරම් මිය, " සෙල්වකොට්, පොතුවිල්.
03. මහේස්වරී අරුලානන්දම් මිය, අංක 38, කොලින්වුඩ්ස් ලේන්, වැල්ලවත්ත.
03. රේණුකා දේවි කනගසබේ මිය, අංක 11, රාමක්‍රිෂ්ණ ගාර්ඩන්, වැල්ලවත්ත, කොළඹ.

ප්‍රමාණය: හෙක්. 2.428

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ " 1986.04.21 වැනි දින පූ. හා. 10.00ට බලංගොඩ උප දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි" යන්න, "2015.02.16 දින පූ. හා. 10.00 ට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය" යනුවෙන් සංශෝධනය විය යුතු වන අතර, 2015.02.16 දින පෙ. ව. 10.00ට හිමිකම් කියන්නන් විසින් ඉහත පරිදි හිමිකම් ඉදිරිපත් කළ යුතුයි. හා

තව ද, "1986.04.07" දිනට මත්තෙන් යන්න "2015.02.02" දිනට මත්තෙන් යන්න සංශෝධනය විය යුතු අතර, එදිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2014 දෙසැම්බර් මස 23 වැනි දින
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

01-332

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.